දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/2/1/5/2/1/2012
ඔබේ අංකය / உமது இல. / Your No.: ජමාප/පඅ/3/05/12/01/100
දිනය / திகதி / Date: 2014- 06- 16

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
07 JUL 2014
කොළඹ.

ලේකම්
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පරිපාටි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සකස් කිරීම</u>

උක්ත කරුණට අදාළව ඔබේ සමාංක හා 2014-05-28 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ශ්‍රේණය (MN-3-2006 A) සඳහා වන සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මෙම බඳවා ගැනීම් පරිපාටිය පිළිබඳ අදාළ නිලධාරින් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ඩබ්ලිව්. බී. පී. සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්: 1) රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමඟ එවමි).
2) ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමඟ එවමි).
3) ආයතන අධ්‍යක්ෂ ජනරාල් (මුල් පිටපත මේ සමඟ එවමි).

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර-තාක්ෂණික සේවා ගණය (MN-03-2006-A) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

**01.** සම්බන්ධ වන ආයතන :

| | | |
|---|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව : රජයේ ප්‍රවෘත්ති | යොමු අංකය :<br>රප්‍ර/ආ01/11 | දිනය :<br>2012.12.14 |
| 1.2. අමාත්‍යාංශය : ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | යොමු අංකය :<br>එම්එම්අයි/05/12/1/100 | දිනය :<br>2013.01.03 |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම<br>සංශෝධිත | යොමු අංකය :<br>DMS/C6/44/01-Vol-II<br>DMS/C/6/44/01-Vol-II | දිනය :<br>2012.08.20<br>2013.01.22 |
| 1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය :<br>EST-2/RECRU/02/0242<br>EST-2/RECRU/02/0283 | දිනය :<br>2012..03.30<br>2013.02.18 |
| 1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය :<br>NSCC/6/5/093/SR<br>NSCC/6/5/093/SR-III | දිනය :<br>2012.04.17<br>2013.03.05 |
| 1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය :<br>PSC/EST/2/1/5/2/1/2012 | දිනය :<br>2014.04.08 |

**02.** පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

3.2. ශ්‍රේණි : III, II හා I යනුවෙන් ශ්‍රේණි තුනකින් සමන්විතය

3.3. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ කාර්මික හා තාක්ෂණික කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරේ ස්වභාවය : මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

**05.** වැටුප් :

5.1. වැටුප් කේත අංකය : MN 03 – 2006 (A)

5.2. වැටුප් පරිමාණය : රු. 15,005 – 4 × 180 – 6 × 240 – 11 × 320 – 20 × 360 – 27,885 /-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 | . 15,005 / - |
| II ශ්‍රේණිය | පියවර 12 | 17,485 / - |
| I ශ්‍රේණිය | පියවර 23 | 21,045 / - |

**06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

6.1. අනුමත තනතුරු නාමය, අනුමත තනතුරු සංඛ්‍යාව හා එයට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අඳුරු කාමර ඡායාරූප මුද්‍රණකරු | III | 01 | 1. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් හා වගකිවයුතු වෙනත් ඕනෑම නිලධාරියෙකු විසින් පවරන ඡායාරූප මුද්‍රණ කටයුතු සම්බන්ධ රාජකාරි ඉටු කිරීම.<br>2. ප්‍රධාන ඡායාරූප ශිල්පී විසින් පවරන ඡායාරූප මුද්‍රණ කටයුතු නිසි ලෙස ඉටුකිරීම.<br>3. මුද්‍රණය කරන ඡායාරූප හා අදාළ සේයාපටල නිසි ලෙස නැවත අදාළ නිලධාරීන්ට භාරදීම.<br>4. ඡායාරූප මුද්‍රණ උපකරණ නිසිලෙස පාවිච්චිය හා නඩත්තුව.<br>5. අඳුරු කාමර මුද්‍රණ අමු ද්‍රව්‍ය (ඡායාරූප මුද්‍රණ) නිසිලෙස පාවිච්චිය.<br>6. ඡායාරූප මුද්‍රණ වාර්තා තබා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල අදාළ නිලධාරියාට ඉදිරිපත් කිරීම. |
| තාක්ෂණ නිලධාරි | III,II,I | 10 | දෙපාර්තමේන්තුවේ තාක්ෂණික හා කාර්මික කාර්යයන් ඉටු කිරීම |
| ඡායාරූප ශිල්පී | III,II,I | 10 | දෙපාර්තමේන්තුවේ නිශ්චල ඡායාරූපකරණයට අදාළ කාර්යයන් ඉටුකිරීම |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 21

අඳුරු කාමර ඡායාරූප මුද්‍රණකරු 01*

තාක්ෂණ නිලධාරි 10

ඡායාරූප ශිල්පී 10

* කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක D MS/C6/44/01-Vol-II හා 2012. 08. 20 දිනැති ලිපිය අනුව අඳුරු කාමර ඡායාරූප මුද්‍රණකරු තනතුර දැනට තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ අනුමත කර ඇත.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :** අඳුරු කාමර ඡායාරූප මුද්‍රණකරු තනතුර, තනතුර දරන්නාට පුද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

තාක්ෂණ නිලධාරි හා ඡායාරූප ශිල්පී තනතුරු සඳහා

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70 % |
| සීමිත | 30 % |
| කුසලතා | අදාළ නොවේ |

සටහන : -

I. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවාගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03 ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :

<u>තාක්ෂණ නිලධාරි/ඡායාරූප ශිල්පී තනතුර සඳහා</u>

(I). භෞතික විද්‍යාව / රසායන විද්‍යාව ඇතුළත් ව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත් වීම.

සහ

(II). සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් :

<u>තාක්ෂණ නිලධාරි තනතුර සඳහා</u>

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,

හෝ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

රූකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,
(මෙහිදි රූකියා ක්ෂේත්‍රය යන්න රජයේ චිත්‍රපට අංශයේ වීඩියෝ කැමරාකරණය, සංස්කරණය, ශබ්ද කාර්මික තාක්ෂණය, රසායනාගාර කටයුතු මොටර් වාහන නඩත්තුව හා විදුලි උපකරණ හා ගොඩනැගිලි නඩත්තුව ඇතුළත් වේ.)

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අංශින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

ඡායාරූප ශිල්පී තනතුර සඳහා

තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු, නිශ්චල ඡායාරූපකරණයට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**සංලක්ෂ්‍යය :-** මෙම වෘත්තීය සුදුසුකම් රූකියා ක්ෂේත්‍රයට අදාළ ව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ විය යුතු ය.

7.2.2.3. පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4. කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1. අවම සීමාව : අවුරුදු 18

7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 30

7.2.4 බඳවාගැනීමේ ක්‍රමය :

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

* විවෘත තරග විභාගයට අදාළ විෂය නිර්දේශය ඇමුණුම I හි අමුණා ඇත.

7.2.4.1.1. පවත්වන බලධරයා : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ)
ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණි

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පලකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ .

**7.3. සීමිත බඳවාගැනීම් :**

7.3.1. බඳවාගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2. සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් :

<u>තාක්ෂණ නිලධාරි/ ඡායාරූප ශිල්පී තනතුරු සඳහා</u>

**<u>සිංහල/ දෙමළ /ඉංග්‍රීසි භාෂාව,</u>** විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් :

<u>තාක්ෂණ නිලධාරි තනතුර සඳහා</u>

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,

හෝ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3.2.3. පළපුරුද්ද : ප්‍රාථමික ශිල්පීය නොවන හෝ ඉන් ඉහළ සේවා ශ්‍රේණියක අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

සටහන : - අදාළ ක්ෂේත්‍රය යන්නට රජයේ චිත්‍රපට අංශයේ වීඩියෝ කැමරාකරණය, නිශ්චල ඡායාරූපකරණය, සංස්කරණය, ශබ්ද කාර්මික තාක්ෂණය, රසායනාගාර කටයුතු, මෝටර් වාහන නඩත්තුව හා විදුලි උපකරණ හා ගොඩනැගිලි නඩත්තුව ඇතුළත් වේ.

7.3.2.4. කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් :

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

II. නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් සහතික කර තිබීම.

III. සේවයට බඳවාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.3. වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.4.1. ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| පොදු පරීක්ෂණය<br>(තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 100 | 40 |

* සීමිත තරඟ විභාගයට අදාළ විෂය නිර්දේශය ඇමුණුම II හි අමුණා ඇත.

7.3.4.1.1. පවත්වන බලධරයා: රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2 . වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ)

ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණි

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය

පත්කරනු ලබන බලධරයා : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර දැන්වීමක් මගින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් ප්‍රසිද්ධියට පත් කර අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4.** කුසලතා මත බඳවාගැනීම - අදාළ නොවේ

**08. කාර්යක්ෂමතා කඩඉම් :**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය

**09. භාෂා ප්‍රවීණතාව :**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය

**10. ශ්‍රේණි උසස් කිරීම**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

සටහන - 1 වන හා 2 වන දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා අදාළ වන විෂය නිර්දේශයන් ඇමුණුම III හා ඇමුණුම IV මගින් දක්වා ඇත.

සංලක්ෂය

1. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11.** තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් අනෙකුත් කොන්දෙසි හා විධි විධාන අදාළ වේ.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

" සක්‍රීය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14.** සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

**16.** බඳවා ගැනීම් පරිපාටියට අදාළව මෙහි ඇතුළත් නොවන වෙනත් කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

සකස් කළේ : අත්සන : ..........
2014/05/02

**පී. පී. එන්. කුමාරි**
**සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා පරිපාලන සේවය**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
**කොළඹ 05.**

පරීක්ෂා කළේ : .......... 2014/05/02
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි
අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2014/05/02 නිල මුද්‍රාව : **මහාචාර්ය ආරියරත්න ඇතුගල රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

---

යොමු අංකය : ........../05/12/01/100

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........

නම : ..........

ලේකම්
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දිනය : 2014.05.21 නිල මුද්‍රාව : ..........

---

යොමු අංකය : PSC/EST/2/1/5/2/1/2012

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය

සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2014.04.08 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..........

නම : ..........

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014.06.13 නිල මුද්‍රාව : ..........

ඩී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

01. විභාගයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා බඳවාගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය එකයි | 100 | 40 |
| පොදු පරීක්ෂණය | පැය එකයි | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියක් විනිශ්චය කිරීම සඳහා සැකසූ බහුවරණ ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | තනතුරුවලට අදාළ ව බහුවරණ ස්වරූපයෙන් යුක්ත ප්‍රශ්න හා තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ව්‍යුහගත ස්වභාවයේ ප්‍රශ්නවලින් සමන්විත ය. |

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල
තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/05/02
නිල මුද්‍රාව : මහාචාර්ය ආරියරත්න ඇතුගල
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

01. විභාගයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා බඳවාගැනීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය එකයි | 100 | 40 |
| පොදු පරීක්ෂණය | පැය එකයි | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියක් විනිශ්චය කිරීම සඳහා සැකසූ බහුවරණ ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | තනතුරුවලට අදාළ ව බහුවරණ ස්වරූපයෙන් යුක්ත ප්‍රශ්න හා තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ව්‍යුහගත ස්වභාවයේ ප්‍රශ්නවලින් සමන්විත ය. |

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2014/05/02

නිල මුද්‍රාව : මහාචාර්ය ආරියරත්න ඇතුගල
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම - III

01. විභාගයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා වන පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ප්‍රායෝගික තාක්ෂණ දැනුම | පැය දෙකයි | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාගය පවත්වනු ලැබේ.

04. මෙම දෙපාර්තමේන්තු පරීක්ෂණය අවශ්‍යතාව මත වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ප්‍රායෝගික තාක්ෂණ දැනුම | පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ ව වෙන් වෙන් වශයෙන් ඒ ඒ ක්ෂේත්‍රයේ සෛද්ධාන්තික කරුණු හා ඒවා ප්‍රායෝගික ව යොදා ගැනීම පිළිබඳ දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත ය.<br>1.. නිශ්චල ඡායාරූපකරණය<br>2. වීඩියෝ කැමරාකරණය<br>3. වීඩියෝ සංස්කරණය<br>4. ශබ්ද කාර්මික තාක්ෂණය<br>5. රසායනාගාර කටයුතු<br>6. මෝටර් වාහන නඩත්තුව<br>7. විදුලි උපකරණ හා ගොඩනැගිලි නඩත්තුවවු |

අත්සන : (signature)
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2014/05/02

නිල මුද්‍රාව : මහාචාර්ය ආරියරත්න ඇතුගල
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම - IV

01. විභාගයේ නම :රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| රජයේ කාර්යාල ක්‍රම හා දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය දෙකයි | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාගය පවත්වනු ලැබේ.

04. මෙම දෙපාර්තමේන්තු පරීක්ෂණය අවශ්‍යතාව මත වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| රජයේ කාර්යාල ක්‍රම හා දෙපාර්තමේන්තු රෙගුලාසි | රජයේ කාර්යාලවල කාර්යාල ක්‍රම, භාවිත වන ක්‍රමවේදයන් රීති හා රෙගුලාසි ද රජයේ කාර්යාලයන්හි ක්‍රියාත්මක වන නව ප්‍රතිසංස්කරණ යනාදිය පිළිබඳ අවබෝධ මැන බැලීම සඳහා සකස් කළ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත ය. |

අත්සන : [signature]

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : මහාචාර්ය ආරියරත්න ඇතුගල

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2014/05/

නිල මුද්‍රාව : මහාචාර්ය ආරියරත්න ඇතුගල
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්